# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1938/2 - 2015 ඔක්තෝබර් මස 26 වැනි සඳුදා - 2015.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (II).

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2015 මෝර මත්ස්‍ය කළමනාකරණ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කෞතුකාගාරය විසින් සිදුකරනු ලබන එකතු කිරීම්, චර්ම ශිල්පීය අධ්‍යයන කටයුතු සඳහා ජීව විද්‍යාත්මක සාම්පල එකතු කිරිම හා පර්යේෂණ කාර්ය සඳහා හැර ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර කර්මාන්තයේ නියැලී සිටින කිසිම තැනැත්තකු විසින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මෝර මත්ස්‍ය විශේෂවල යම් මෝර මත්ස්‍යයකු ඇල්ලීම නොකළ යුතු ය.

3. කිසිදු තැනැත්තෙකු විසින් -

(i) දේශීය ධීවර බෝට්ටුවක් තුළ දී එම දේශීය ධීවර බෝට්ටුව මගින් අල්ලා ගනු ලැබූ මෝරකුගේ වරල් කපා ඉවත් කිරීම සහ වරල් ඉවත් කරන ලද මෝර මත්ස්‍යයෙකු බෝට්ටුවෙන් බැහැර කිරීම නොකළ යුතු ය.

(ii) යම් මෝර මත්ස්‍යයෙකුගේ වරල් ස්වභාවිකව එම මත්ස්‍යයාගේ ශරීරයට සම්බන්ධ වී ඇත්නම් මිස, එම මෝර මත්ස්‍යයාගේ වරල් බෝට්ටුව තුළ තබා ගැනීම, වෙනත් බෝට්ටුවකට මාරු කිරීම, හෝ ගොඩබෑම නොකළ යුතු ය.

4. 2 වන නියෝගයේ විධිවිධාන වලට යටත්ව, ධීවර කර්මාන්තයේ යෙදෙන දේශීය ධීවර බෝට්ටුවක හිමිකරුවකු හෝ නියමුවෙකු විසින් සජීවී මෝරුන් විශේෂයෙන් ම සුහුඹුලන් හා ගැබ්ගත් මෝරුන් නිදහස් කළ යුතු ය.


1A - PG 2662 — 1756 (2015/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. මෙම නියෝග මගින් 2001 ඔක්තෝබර් මස 17 වන දින අංක 1206/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2001 (මෝරා සහ මඩුවා මත්ස්‍ය වර්ගවල) මසුන් ඇල්ලීමේ නියෝග සහ 2012 ජුලි මස 27 වන දින අංක 1768/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2012 කස මෝරා මසුන් ඇල්ලීම තහනම් කිරීමේ නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

6. මෙම නියෝගවල ''මෝර මත්ස්‍යයන්'' යන්නට මෝර මත්ස්‍ය විශේෂ ඇතුළත් වේ.

**උපලේඛනය**

1. ඇලෝපිඩේ කුලයට අයත් මෝර මත්ස්‍ය විශේෂ

   ඇලෝපියස් වුල්පිනස් (Thresher shark)
   ඇලෝපියස් සුපර්සිලියසස් (Bigeye thresher shark)
   ඇලෝපියස් පෙලගිකස් (Pelagic thresher shark)

2. පොල් කොළ මෝරා (Ocean whitetip shark)

3. මිණි මුතු මෝරා (Whale shark)

11 - 204/1

---

එල්.ඩී.බී. 1/2012 (II).

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව මගින් ඇතිකරගත් ගිවිසුම් සම්බන්ධයෙන් කළමනාකරණ සහ සංරක්ෂණ පියවර ගැනීමේ කාර්යය සඳහා 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 (1) (ත) වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2015 මෝර මත්ස්‍ය කළමනාකරණ (මහ මුහුදේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කෞතුකාගාරය විසින් සිදුකරනු ලබන එකතු කිරීම්, චර්ම ශිල්පීය අධ්‍යයන කටයුතු සඳහා ජීව විද්‍යාත්මක සාම්පල එකතු කිරිම හා බෝට්ටුව තුළ සිටින විද්‍යාත්මක නිරීක්ෂක විසින් සිදු කරනු ලබන පර්යේෂණ කාර්ය සඳහා හැර මහ මුහුදේ ධීවර කර්මාන්තයේ නියැලී සිටින කිසිම තැනැත්තකු විසින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මෝර මත්ස්‍ය විශේෂවල යම් මෝර මත්ස්‍යයකු ඇල්ලීම නොකළ යුතු ය.

3. මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන කිසිදු තැනැත්තකු විසින් -

(i) දේශීය ධීවර බෝට්ටුවක් තුළ දී එම දේශීය ධීවර බෝට්ටුව මගින් අල්ලා ගනු ලැබූ මෝරකුගේ වරල් කපා ඉවත් කිරීම සහ වරල් ඉවත් කරන ලද මෝර මත්ස්‍යයෙකු බෝට්ටුවෙන් බැහැර කිරීම නොකළ යුතු ය.

(ii) යම් මෝර මත්ස්‍යයෙකුගේ වරල් ස්වභාවිකව එම මත්ස්‍යයාගේ ශරීරයට සම්බන්ධ වී ඇත්නම් මිස, එම මෝර මත්ස්‍යයාගේ වරල් බෝට්ටුව තුළ තබා ගැනීම, වෙනත් බෝට්ටුවකට මාරු කිරීම, හෝ ගොඩබෑම නොකළ යුතු ය.

4. මහ මුහුදේ ධීවර කර්මාන්තයේ නියැලී සිටින කිසිම තැනැත්තකු විසින් දේශීය ධීවර බෝට්ටුවක් තුළ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් මෝර මත්ස්‍ය විශේෂයක මෝර මත්ස්‍යයකු හෝ එවැනි මත්ස්‍යයකුගේ ශරීර කොටසක් තබා ගැනීම, වෙනත් බෝට්ටුවකට මාරු කිරීම, ගොඩබෑම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා අර්පනය කිරීම නොකළ යුතු ය.

5. මහ මුහුදේ හැඹිලි දැල් මගින් ධීවර කර්මාන්තයේ යෙදෙන කිසිම තැනැත්තකු විසින් සිතා මතා මිණි මුතු මෝරා (Rhiniodon typus) මත්ස්‍යයන් ගැවසෙන ප්‍රදේශවල හැඹිලි දැල් එළීම නොකළ යුතු ය.

6. 2 වන නියෝගයේ විධිවිධාන වලට යටත්ව, මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන දේශීය ධීවර බෝට්ටුවක හිමිකරුවකු හෝ නියමුවෙකු විසින් මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් මෝර මත්ස්‍ය විශේෂයක් අහඹු ලෙස අල්ලා ගනු ලැබූවිට -

(i) ප්‍රායෝගිකව හැකිතාක් දුරට එම මත්ස්‍යයාට හානියක් නොකර මුහුදට මුදා හැරිය යුතු ය.

(ii) අල්ලා ගනු ලැබූ සංඛ්‍යාව, ස්ථානය, ආරක්ෂිතව නිදහස් කිරීම සඳහා ගනු ලැබූ පියවර ඇතුළුව එම මත්ස්‍යයා මුහුදට මුදා හැරීම හෝ බැහැර කිරීම පිළිබඳව එම දේශීය ධීවර බෝට්ටුවේ පවත්වාගෙන යන ලොග් සටහන් පොතේ සටහනක් තැබිය යුතු ය.

(iii) සජීවී මෝරුන් විශේෂයෙන් ම සුහුඹුලන් සහ ගැබ්ගත් මෝරුන් නිදහස් කළ යුතු ය.

7. මෙම නියෝග මගින් 2001 ඔක්තෝබර් මස 17 වන දින අංක 1206/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2001 (මෝරා සහ මඩුවා මත්ස්‍ය වර්ගවල) මසුන් ඇල්ලීමේ නියෝග සහ 2012 ජූලි මස 27 වන දින අංක 1768/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2012 කස මෝරා මසුන් ඇල්ලීම තහනම් කිරීමේ නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

8. මෙම නියෝගවල ''මෝර මත්ස්‍යයන්'' යන්නට මෝර මත්ස්‍ය විශේෂ ඇතුළත් වේ.

### උපලේඛනය

1. ඇලෝපිඩේ කුලයට අයත් මෝර මත්ස්‍ය විශේෂ

ඇලෝපියස් වුල්පිනස් (Thresher shark)
ඇලෝපියස් සුපර්සිලියසස් (Bigeye thresher shark)
ඇලෝපියස් පෙලගිකස් (Pelagic thresher shark)

2. පොල් කොළ මෝරා (Ocean whitetip shark)

3. මිණි මුතු මෝරා (Whale shark)

11 - 204/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.